© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2009 මාර්තු විභාගය

| | | | |
|---|---|---|---|
| විභාග දිනය | : 2009 මාර්තු 21 | පිටු ගණන | : 05 |
| විභාග වේලාව | : පෙ.ව. 9.30 - ප.ව. 12.30 | ප්‍රශ්න ගණන | : 06 |

අයදුම්කරුවන්ට උපදෙස්ඃ
1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| මූලික මූල්‍ය ගිණුම්කරණය | (FAF / 501) |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 16)*

(a) ව්‍යාපාර සංවිධාන කටයුතුවල වෙනස්කම් ගිණුම්කරණ අරමුණු අනුව සැලකිල්ලට ගත් විට ප්‍රධාන ප්‍රවර්ග (categories) 5 කට බෙදිය හැකි ය. මේ ප්‍රවර්ග (categories) 5 නම් කොට, ඒවා එකිනෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(b) ව්‍යාපාරයක ගනුදෙනුවලට අදාළව මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ගිණුම්කරණ ප්‍රවාහයේ විවිධ අවස්ථා ලැයිස්තුගත කරන්න. ඒ එක් එක් අවස්ථාව ද කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(c) වංචා සිදුවන අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශ සාවද්‍ය ලෙස ඉදිරිපත් වේ. මෙම විෂය සඳහා සකස් වූ, අධ්‍යයන පුස්තකයේ ද සඳහන් වන, මේ වංචා හය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 15)

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 17)*

(a) ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී පහත සංකල්ප අනුගමනය කරනු ලබයි. මෙම සංකල්ප දෙක භාවිත කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.
(i) සැසඳීමේ හැකියාව
(ii) විචක්ෂණභාවය (ලකුණු 07)

(b) අනුර, බිමල් සහ චරිත හොඳ මිතුරන් වූ අතර තිදෙනා එකතු වී ව්‍යාපාරයක් කිරීමට කැමැත්ත දක්වූහ. එහෙත් එය හවුල් ව්‍යාපාරයක් ලෙස ද, නැතහොත් සීමිත සමාගමක් ලෙස පවත්වාගනු ලබන්නේ දැයි නිශ්චිත නොවීය. එම සංවිධාන එකිනෙක පිහිටුවන අන්දම, ඒවා සම්බන්ධ නෛතික වගකීම්වල වෙනස්කම් සහ ඒවායෙන් සාමාජිකයින්ට අත්වන ප්‍රතිලාභ කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 17)

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 17)</u>*

අවසානයේ දී අනුර, බිමල් සහ චරිත හවුල් ව්‍යාපාරයක් පිහිටුවා සැළකිය යුතු ප්‍රමාණයේ සිල්ලර වෙළෙඳාමක් කළහ. අනුර, බිමල් සහ චරිත 3:2:1 අනුපාතයෙන් ලාභාලාභ බෙදා ගනිති. ඔවුන්ගේ ව්‍යාපාරයේ 2008.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැයට | 300,000 | |
| මෝටර් වාහන පිරිවැයට | 200,000 | |
| කාර්යාල හා අනිකුත් උපකරණ පිරිවැයට | 40,000 | |
| ගැනුම් | 850,000 | |
| විකුණුම් | | 1,200,000 |
| විකුණුම් ආපසු එවුම් | 100,000 | |
| ණය - චරිතගෙන් 2008.01.01 දිනට | | 30,000 |
| ක්ෂය සඳහා වෙන්කිරීම: | | |
| මෝටර් වාහන | | 80,000 |
| ගොඩනැගිලි | | 60,000 |
| කාර්යාල සහ අනිකුත් උපකරණ | | 20,000 |
| 2008.01.01 දිනට තොග | 200,000 | |
| බැංකුවේ සහ අත ඉතිරි මුදල් | 75,300 | |
| වෙළෙඳ ණයගැතියෝ | 235,000 | |
| වෙළෙඳ ණයහිමියෝ | | 439,000 |
| බොල් ණය සඳහා වෙන්කිරීම (01.01.2008) | | 10,000 |
| හවුල්කරු ප්‍රාග්ධන ගිණුම්: | | |
| අනුර | | 180,000 |
| බිමල් | | 120,000 |
| චරිත | | 60,000 |
| වරිපණම් සහ රක්ෂණ | 40,000 | |
| කාර්යාල වියදම් | 40,000 | |
| විකිණීමේ වියදම් | 14,000 | |
| බැංකු ගාස්තු | 10,000 | |
| හවුල්කරු ජංගම ගිණුම්: | | |
| අනුර | | 3,300 |
| බිමල් | 5,000 | |
| චරිත | | 7,000 |
| ගැනිලි: | | |
| අනුර | 40,000 | |
| බිමල් | 30,000 | |
| චරිත | 30,000 | |
| | 2,209,300 | 2,209,300 |

**පහත දැක්වෙන තොරතුරු අදාළ වේ.**

(i) 2008.12.31 දිනට තොග වටිනාකම රු. 300,000 ක් විය.

(ii) පහත සඳහන් පරිදි ක්ෂය වෙන් කළ යුතුය:
- ගොඩනැගිලි (පිරිවැය රු. 200,000) - වාර්ෂිකව පිරිවැයෙන් 5% ක්
- මෝටර් වාහන - වාර්ෂිකව පිරිවැයෙන් 20%
- කාර්යාල හා වෙනත් උපකරණ - වාර්ෂිකව පිරිවැයෙන් 10%

(iii) රු. 5,000 බොල් ණය කපාහරිමින් අඩමාන ණය සඳහා 2% ක් වෙන් කළ යුතු ය.

(iv) හවුල් ගිවිසුම අනුව:
1. කළමනාකරණ හවුල්කරු වශයෙන් අනුරට මසකට රු. 4,000 ක වැටුපක් හිමි ය.
2. වසර අග හවුල්කරු ප්‍රාග්ධන මත 5% ක වාර්ෂික පොලියක් හිමි ය.
3. හවුල්කරු ණය මත 12% ක වාර්ෂික පොලියක් ලැබෙන අතර ගැනිලි සඳහා 12% ක වාර්ෂික පොලියක් අය වේ.

පිළියෙල කරන්න.

(a) 2008 වර්ෂයේ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම

(b) හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ විසර්ජන ගිණුම

(c) හවුල්කරු ජංගම ගිණුම්

(මුළු ලකුණු 17)

**<u>ප්‍රශ්න අංක 04</u>** *(ලකුණු 12)*

සීමිත යුට්ලිට් සමාගම ගෘහස්ථ කටයුතු සඳහා ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කරයි. 2008 දෙසැම්බර් මස 31 දිනට ඔවුන්ගේ ගිණුම්වල පහත සඳහන් ශේෂ දක්වේ.

| | රු. |
|---|---|
| 2008.01.01. දිනට තොගඃ | |
| අමුද්‍රව්‍ය | 26,700 |
| නොනිමි භාණ්ඩ | 6,900 |
| නිමි භාණ්ඩ | 24,000 |
| පරිශ්‍ර වරිපණම් | 3,700 |
| වර්ෂය තුළ අමුද්‍රව්‍ය මිලට ගැණුම් | 298,000 |
| කර්මාන්තශාලා අධීක්ෂකගේ වේතන | 144,000 |
| කර්මාන්තශාලා අතිකාල | 28,000 |
| කර්මාන්තශාලා සේවක වැටුප් | 210,000 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු වියදම් | 6,000 |
| ගොඩනැගිලි අලුත්වැඩියා | 27,000 |
| රක්ෂණ ගාස්තු | 12,000 |
| විදුලිය, බලය සහ උෂ්ණය | 37,000 |
| ගෙන ඒමේ කුලී | 4,000 |
| පිරියත සහ යන්ත්‍ර (පිරිවැයට) | 370,000 |
| කර්මාන්තශාලා මෙවලම් සහ උපකරණ | 110,000 |
| කර්මාන්තශාලා ගොඩනැගිලි | 200,000 |

පහත දක්වෙන තොරතුරු අදාළ වේ.

(i) පරිශ්‍ර වරිපණම්වලින් 2/5 ක් කර්මාන්තශාලා ගොඩනැගිලි පිහිටි ක්ෂේත්‍රයට අදාළ ය.

(ii) රක්ෂණ වියදම්වලින් 4/5 ක් ආවරණය කෙරෙන්නේ යන්ත්‍රසූත්‍ර සහ උපකරණයි.

(iii) පිරියත සහ යන්ත්‍රසූත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% කට ක්ෂය කෙරෙන අතර, කර්මාන්තශාලා ගොඩනැගිලි වෙනුවෙන් පිරිවැයෙන් 5% ක් ක්ෂය වෙන් කළ යුතු ය.

(iv) කර්මාන්තශාලා අතිකාල දීමනා සෘජු ශ්‍රමය වෙනුවෙනි.

(v) අර්ධ වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ නිෂ්පාදන කටයුතු සඳහා කම්හලේ තවත් අංශයකට යැවීමට පෙර පිරිසිදු කරනු ලැබේ. මේ සඳහා 2008 වර්ෂයේ පිරිවැය රු. 8,000 කි.

(vi) 2008 දෙසැම්බර් 31 තොග පිරිවැයට පහත සඳහන් පරිදි ය.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය | රු. 18,000 |
| නොනිමි භාණ්ඩ තොගය | රු. 5,900 |
| නිමි භාණ්ඩ තොගය | රු. 20,000 |

අවශ්‍යවන්නේඃ
2008.12.31 දිනෙන් අවසන් වසර සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

(මුළු ලකුණු 12)

**ප්‍රශ්න අංක 05** *(ලකුණු 27)*

සබන්, පවිත්‍රකාරකයන් සහ සමාන භාණ්ඩ ආදිය වෙළෙඳාම් කරන SDA සමාගමේ 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වෙයි.

| | | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|---|
| 8% වරණීය කොටස් ප්‍රාග්ධනය | | | 50,000 |
| රු. 10 සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | | 250,000 |
| 10% ණයකර | | | 50,000 |
| කොටස් අධිමිල ගිණුම | | | 30,000 |
| පොදු සංචිතය | | | 20,000 |
| ලාභාලාභ ගිණුම 2008.01.01 දිනට ශේෂය | | | 40,000 |
| පරිශ්‍රය (පිරිවැය රු. 100,000) | ක්ෂය කළ අගය | 90,000 | |
| කාර්යාල උපකරණ (පිරිවැය රු. 90,000) | ක්ෂය කළ අගය | 60,000 | |
| ලී භාණ්ඩ සහ සවිකිරීම් (පිරිවැය රු. 70,000) | ක්ෂය කළ අගය | 50,000 | |
| මෝටර් වාහන (පිරිවැය රු. 240,000) | ක්ෂය කළ අගය | 120,000 | |
| කීර්තිනාමය (පිරිවැයට) | | 100,000 | |
| 2008.01.01 ට තොග (පිරිවැයට) | | 8,500 | |
| ගැනුම් | | 362,000 | |
| විකුණුම් | | | 702,700 |
| ගෙන ඒමේ කුලී | | 18,100 | |
| අධ්‍යක්ෂ ගාස්තු | | 20,000 | |
| කාර්යාල වැටුප් සහ වේතන | | 130,200 | |
| වරිපනම් | | 11,200 | |
| සන්නිවේදන ගාස්තු | | 12,400 | |
| ණයකර පොලී | | 5,000 | |
| බැංකු ගාස්තු | | 3,600 | |
| බෙදාහැරීමේ වියදම් | | 12,400 | |
| ආයෝජන | | 133,000 | |
| වෙළෙඳ ණයගැතියෝ | | 52,000 | |
| බොල් ණය | | 1,200 | |
| සේ.අ.අ. ගාස්තු සහ සේ.නි.භා.අ. ගාස්තු (EPF & ETF) | | 19,500 | |
| ආයෝජන ආදායම් | | | 13,000 |
| වෙළෙඳ ණයහිමියෝ | | | 35,000 |
| බැංකු ණය (වාර්ෂික පොලී 15%) 2008.01.01 දිනට | | | 30,000 |
| ගෙවූ බැංකු ණය පොලී | | 4,000 | |
| බැංකුවේ සහ අත ඉතිරි මුදල් | | 7,600 | |
| | | 1,220,700 | 1,220,700 |

**පහත සඳහන් තොරතුරු අදාළ වේ.**

(i) ක්ෂය වෙන්කළ යුත්තේ:
- පරිශ්‍රය (පිරිවැය රු. 100,000) - ගත් මිලට 5% බැගින්
- කාර්යාල උපකරණ - ක්ෂය කළ වටිනාකමින් - 10% බැගින්
- ලී භාණ්ඩ සහ සවිකිරීම් - ක්ෂය කළ වටිනාකමින් - 10% බැගින්
- මෝටර් වාහන - සරල මාර්ග ක්‍රමයට - 25% බැගින්

(ii) 2008 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග වටිනාකම රු. 17,000 කි.

(iii) වරණීය ලාභාංශ ගෙවීමටත්, සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයට 10% ක ලාභාංශ ප්‍රකාශ කිරීමටත්, ලාභයෙන් රු. 20,000 සාමාන්‍ය සංචිතයට මාරු කිරීමටත් අධ්‍යක්ෂවරු තීරණය කළහ.

අවශ්‍යවන්නේ:
අභ්‍යන්තර කාර්යයන් සඳහා

(a) 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වෙළෙඳ සහ ලාභාලාභ ගිණුම ද, ලාභාලාභ විසර්ජන ගිණුම ද

(b) 2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය ද පිළියෙල කරන්න.

**(මුළු ලකුණු 27)**

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 11)</u>*

රේන්ජර්ස් ක්‍රිකට් සමාජය ඔවුන්ගේ 40 වැනි සංවත්සරය වෙනුවෙන් 2008 දෙසැම්බර් මස 26 වන දින පරිණතයන්ගේ ක්‍රිකට් තරඟයක් සහ සාමාජිකයන්ගේ පවුල්වල සුහද එකමුතුවක් පැවැත්වූහ. පහත සඳහන් ලැබීම් සහ ගෙවීම් මෙම උත්සවය සම්බන්ධයෙන් සිදු විය.

| | රු. |
|---|---|
| පරිත්‍යාග සහ දායකවීම් | 30,000 |
| තරඟ ප්‍රවේශපත් අලෙවිය | 20,000 |
| සමරු කලාප අලෙවිය | 15,000 |
| සංග්‍රහ ඇතුළු තරඟයේ වියදම් | 13,000 |
| මුද්‍රණ ගාස්තු | 4,000 |

ක්‍රීඩා සමාජයේ බීමහල සාමාජිකයන්ට සති අන්ත සැන්දෑවන්හි විවෘත ය. ජනවාරි 01 වන දින එහි රු. 2,500 ක් පිරිවැය වූ තොග තිබිණි. මෙහි වසර තුළ අලෙවිය රු. 38,790 ක් විය. අර්ධ කාලීන බීමහල් සේවක වේතන රු. 10,400 ක් වූ අතර, සැපයුම් පිරිවැය රු. 18,000 ක් විය. දෙසැම්බර් 31 දිනට බීමහලේ තොගය රු. 2,700 ක් විය.

ක්‍රීඩා සමාජයේ වසරකට රු. 1,000 බැගින් ගෙවන සාමාජිකයන් 90 ක් වූ අතර, 2008 වර්ෂය තුළ යාවජීව සාමාජිකයින් දෙදෙනෙක් රු. 10,000 බැගින් සාමාජික මුදල් ගෙවා බැඳුණාහ.

ජනවාරි 01 දිනට ඉදිරියට ගෙවා ඇති සාමාජික මුදල් රු. 3,000 කි. වර්ෂය තුළ ලැබී ඇති සාමාජික මුදල රු. 107,000 කි. 2009 වසර සඳහා කිසිදු සාමාජිකයෙකු මුදල් ගෙවා නැත.

කාර්ය මණ්ඩල වේතන රු. 48,000 ක් විය. නැරඹුම් ශාලා ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා රු. 6,000 ක් වැය විය. රු. 7,500 ක් පිරිවැය වූ රෝලරය රු. 1,500 ක් දක්වා ක්ෂය කර තිබී රු. 1,000 කට විකිණීමට යෙදිණ. ක්‍රීඩා භූමිය රු. 75,000 ක් පිරිවැය වූවකි. එය ක්ෂය නොකරන අතර, ක්ෂය අඩු කළ පසු අගය රු. 40,000 ක් වූ එම වටිනාකමෙන් 5% ක් ක්ෂය කළ යුතු ය. පිරිවැය රු. 5,000 ක් වූ ක්‍රීඩා උපකරණ ක්ෂය නොකළ යුතු ය.

ක්‍රීඩා සමාජයට ජනවාරි 01 වන දින බැංකු ඉතිරිකිරීම් ගිණුමක රු. 12,000 ක් තිබුණි. නමුත් දෙසැම්බර් 31 දිනට පැවතියේ බැංකු ජංගම ගිණුමක රු. 5,000 ක අයිරාවකි.

**අවශ්‍යවන්නේ:**

(a) 2008 ජනවාරි 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් සහ වියදම් ගිණුම ද **(ලකුණු 07)**

(b) 2008 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල ද ගණනය කොට දැක්විය යුතු ය. **(ලකුණු 04)**

**(මුළු ලකුණු 11)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***